

# “මල්ලි පපුව වගේම ඔලුවත් හොඳට හදාගන්න”

## විප්ලවවාදියකුගේ සැබෑ කතාව

සැබෑ මිනිසකු කියන සත්‍ය කතාව
අසා ලියන්නේ
**ජගත් ජේ එදිරිසිංහ**

6

සැබෑ වාමාංශිකයා තමා දරන මතවාදය වෙනුවෙන් බැරෑරුම් ලෙස පෙනී සිටින අතර සියලු මත වලටද ඇහුම් කන් දෙන්නකු බව මම තේරුම් ගනිමින් සිටියෙමි. මේ බව මා හොඳින් පසක් කරගත් සිදුවීමක් මට හොඳින් මතකය.

79 වර්ෂය අග භාගයේදී පමණ පක්ෂය විසින් ක්‍රියාත්මක කරන ලද “සංවර්ධන සතිය” වැඩ සටහන එතෙක් මෙතෙක් පක්ෂය විසින් දියත් කළ දැවැන්තම ප්‍රචාරක ව්‍යාපාරයයි. සතියක් තුළ ගෙයින් ගෙට යමින් ජනතාව දැනුම්වත් කළ මේ ව්‍යාපෘතිය අප වඩාත් ජනතාව අතරට ගෙන ගියායි මට සිතෙයි. මේ ව්‍යාපෘතියේදී අප අයත්ව සිටියේ ගාලු දිස්ත්‍රික් කණ්ඩායමටය. සෑම උදෑසනකම අපි එක්තරා නියමිත ස්ථානයකට රැස්වී කුඩා කණ්ඩායම් වශයෙන් වෙන්වී දිස්ත්‍රික්කයේ එක් එක් ආසනයේ එක් එක් නගරය කරා ගොස් දවස පුරාම ජනතාව හමුවුණෙමු.

අපේ කණ්ඩායමේ නායකත්වය දැරුවේ එවකට දේශපාලන මණ්ඩල සභිකයකු වූ ධර්මදාස ජයසිංහ සහෝදරයාය. පෙරදී විදුහල්පතිවරයකුව සිටි ඔහු අවංක, ශූර, කථිකත්වයකින් හෙබි, ක්‍රියාශීලී ප්‍රියමනාප පුද්ලගලයකු විය.

සතියේ තුන්වන දින අප වැඩ කරමින් සිටියේ රත්ගම නගරයේ ය. දැන් නගරයක් වී ඇති රත්ගම එකල වැඩි විශාල නැති හන්දියක් බව මට මතකය. අප කණ්ඩායමේ සාමාජිකයෝ නව දෙනෙක් වූහ. ජනතාව හමුවෙමින් සුහදව කතා කරමින් ඔවුන් හා සංවාද කරමින් පැමිණි අප මග හරස් කර අප හා සංවාදයකට එළැඹුණේ මුහුණ පුරා රැවුළ වවා ගත් පාංශු දේහධාරී මැදිවියේ පුද්ගලයෙකි. ඔහුට අපෙන් අසන්නට බොහෝ දේ තිබුණ බවක් පෙනුණි. ඉතා සුහදව ආරම්භ වූ කතාව ක්‍රමයෙන් වාග් සංග්‍රාමයක් බවට පත් වෙමින් තිබුණි. ජවිපෙ හා ලාංකික වාමාංශික ව්‍යාපාරය ලෝක ධනවාදී කඳවුර ආදී විවිධ මාතෘකා ඔස්සේ සංවාදය ඇදී ගියේය. ද්වන්ධාත්මක සටනේ දෙපසේ සිටියේ මේ පුද්ගලයා සහ ධර්මදාස ජයසිංහ සොහොයුරා ය.

ඉතා කුඩා සිද්ධියකට වුවද ක්ෂණිකට ජනතාව රැස්වන එසේම ප්‍රකෝපකාරී ජන සමූහයක් වෙසෙන ප්‍රදේශ ලෙස කොස්ගොඩ, බලපිටිය, රත්ගම ප්‍රසිද්ධ බව අපි දැන සිටියෙමු. කුමකින් කුමක් වේදැයි දෙගිඩියාවෙන් අප බලා සිටිද්දී සංවාදය උනුසුම් වෙමින් ඉදිරියට යයි. අප වටා රැස්වෙමින් සිටින පිරිස ද ක්‍රමයෙන් වැඩිවෙයි. අවසානයේ ඒ පිරිස දෙසියය ඉක්මවන්නට ඇතැයි යන්න මගේ තක්සේරුව විය. තරුණයන් වූ අප දැන් දැන් මේ වාදය අවසන් වේ යයි බලමින් සිටියද මේ පරිණත වාමාංශිකයන් දෙදෙනාගේ මහ පාරේ වාදය පැය තුනක් දක්වා ඇදී ගියේය. අවසානයේ ජයග්‍රාහකයකු හෝ පරාජිතයකු නැතිවම වාදය අවසන් වූයේ රැස්ව සිටි පිරිසගේ අත්පොළසන් නාදය මැද්දේය.

මේ වාදය අපේ සිතේ ඇති කළේ පහන් සංවේගයකි. ඉතා ප්‍රකෝපකාරී ජනතාවක් වෙසෙන ප්‍රදේශයක් වන රත්ගම ප්‍රදේශයේ ජනතාව මහපාරේ වාදය සාවධානය අසා සිටි ආකාරය විශ්මයක් යයි අපට සිතුණි. අප එතැනින් පිටව යන්නට සැරසුණ මොහොතේ ඔවුහු අප නවතාගෙන දිවා ආහාරයද වහ වහා සූදානම් කර දුන්හ. දිවා භෝජනයෙන් අනතුරුව අපි සමුගන්නට සූදානම් වන විට පිරිසෙන් එක් අයෙක් අපේ කන්ඩායමේ සිටි ළාබාලම සාමාජිකයා වූ මා වෙතට පැමිණ මගේ කරට අතක් දමා ගත්තේ ය.

“මල්ලි පපුව වගේම ඔලුවත් හොඳට හදාගන්න” ඔහු කීවේ ඉතා හෘදයාංගමව ය.

මේ සුවිශේෂී දවස පිළිබඳ මතකය මගේ සිතට එත්ම නැගෙන තවත් සිතුවිල්ලක් වන්නේ විරුද්ධ මත සාවධානව ඉවසා සිටින්නට ඒ කාලයේ වාමාංශිකයන් තුළ තිබූ සංයමය පිළිබඳ ගෞරවයයි. එකිනෙකා කෙරහි පෞද්ගලික වෛර පටලවා ගන්නේ නැතිව එකිනෙකාට පුද්ගලික අපහාස කරගන්නේ නැතිව අනෙකාගේ මතයට ගරු කිරීමේ ඒ බුද්ධිමත් පැවැතුම් අද සමාජයෙන් බැහැරව යමින් තිබෙන්නේ යයි මට සිතෙයි.

සංවර්ධන සතිය අවසන් කර මා නැවත නිවසට ආවේ මාස දෙක තුනකට පමණ පසුවය. නිවසේ ගත කළ දවස් කීපයේම මගේ කල්පනාවට ආවේ රත්ගම දී ධර්මදාස ජයසිංහ සොහොයුරා සහ අනෙක් පුද්ගලයා තම වාදයේදී ඉදිරිපත් කළ තර්ක වල තිබූ සාරවත් බව සහ ඔවුන්ගේ දැනුම් පරාසයේ සුවිසල් බවත් ය. ප්‍රශ්නයකදී එයට ගැලපෙනම සාර්ථක පිළිතුර ක්ෂණිකව ඉදිරිපත් කරන්නට ඔවුන් දැක් වූ සමත් කම පිළිබඳ විස්මය මගේ සිත මා පිළිබඳවම තක්සේරුවක් කරන්නට පෙළඹවීය. මම මහත් ජවයකින් පක්ෂයේ පූර්ණකාලිකයකු ලෙස සේවය කරමින් සිටියෙමි. විප්ලවවාදී පක්ෂයක සාමාජිකයකුට ඒ ජවය පමණක්ම ඇතිද? ඔහු දැනුමින් කොයි තරම් සන්නද්ධ විය යුතුද? මට මා ගැනම ලැජ්ජාවක් ඇති විය. පක්ෂයේ පිටුපසින්ම සිටින ලාබාල තරුණ බලවේග දැනුමින් සන්නද්ධ කරන්නට පක්ෂය මෙයට වඩා කැපවීමක් දැරිය යුතු නොවේද?

නිදිවර්පිතව රාත්‍රි දෙකක් ගත කළ මම විප්ලවවාදීන් බිහිකළ නොහැකි බව පළමු වතාවට පසක් කර ගත්තෙමි. විප්ලවවාදීන් බිහි කළ නොහැකිය. ඔවුහු බිහිවිය යුත්තෝය.

පක්ෂය අපට උපදෙස් හා මාර්ගය පෙන්වා දී ඇත. අපි ඒ ඔස්සේ ඉදිරියට යා යුතු වෙමු.

මම නිවසේ නැවතී සිට පක්ෂයේ කටයුතු කරන්නට අවසරය ලබා ගතිමි. විප්ලවීය ජීව ගුණය සෝවියට් සාහිත්‍යය ඔස්සේ ද ලෝක වාමාංශික ව්‍යාපාර වල ජයග්‍රහණ ඔස්සේද සොයන්නට කළ උත්සාය වෙනුවට න්‍යායාත්මක දේශපාලන අධ්‍යයනයක යෙදෙන්නට මම සිත යොමු කළෙමි. මාක්ස්වාදයේ න්‍යායික පැත්ත පිළිබඳ අවබෝධය වැඩිවත්ම අප ලෝකය දෙස බැලූ ආකාරයේ - කෝණයේ - විශාල වෙනසක් වෙමින් තිබෙන බවක් මට දැනෙන්නට විය. මේ අධ්‍යයනය සඳහා මට බොහෝ උපකාර කළේ දයා සහෝදරයාය.

නිවසේ සිට පක්ෂයේ කටයුතු කිරීම ආරම්භ කිරීමත් සමගම දුරස්ව තිබූ පවුල පිළිබඳ හැඟීමද වැඩි වූයේ යයි මට සිතෙයි. මගේ සහෝදර සහෝදරියන් මා කරමින් සිටින කාර්යය පිළිබඳ මනා අවබෝධයකින් සිටින බව මම තේරුම් ගත්තෙමි.

80 දශකය ආරම්භ වන විට බිම වැටී සිටි පක්ෂය අලු ගසා දමමින් වේගයෙන් නැගිටිමින් සිටින අතර පාලක යූඑන්පී රජයේ මධු සමය අවසන් වෙමින් තිබුණි. පක්ෂය ප්‍රසාරණය වෙමින් තිබූ වේගය අනුව ඔවුනට ඉදිරියේ තර්ජනයක් වන්නේ ජවිපෙ බවද ඔවුහු තේරුම් ගනිමින් සිටියහ. අපේ වැඩ කිරීමේ රටාව හා අදහස් රටාව අනුව බොහෝ විට අප හා අලුතින් එක්වෙමින් සිටියේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ පිරිස්ය. මේ ගැන රජය දැන සිටියද ඔවුන් ඒ පිළිබඳව සතුටු වී සිටියද අපේ පැවැත්ම අනාගතයේ තමන්ට මහත් තර්ජනයක් වන බවද ඒ සමගම වටහා ගත්හ. ඒ නිසා අපට එරෙහිව ප්‍රහාර හා විරුද්ධවාදීකම් රටේ තැනින් තැන ආරම්භ කර තිබුණි. කලුතර දිස්ත්‍රික්කයේ අපේ ප්‍රචාරක කටයුතු වලට හරස් කැපෙන්නේ මේ හරභාය. අත් අඩංගුවට පත් වීමේ මගේ පළමු අත්දැකීම ද ලැබෙන්නේ අපේ බැනර කපා දැමීමකට ප්‍රතිචාර දැක්වීමට ගිය අවස්ථාවකදීය.

**මතු සම්බන්ධයි**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com